# 2 වර්ගයේ ගම්බද පාසල් වල මානව හා භෞතික සම්පත් කළමනාකරණයේ දී ඇතිවන ඌනතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරින්)

පී.ආර්.එස්.විජය වික්‍රම.

UCLIB
493070

අධ්‍යාපන දර්ශනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය කිරීම සඳහා

ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

University of Colombo
Library
Sri Lanka

# සංක්ෂිප්තය

අධ්‍යාපනය වූ කලී මිනිස් ඉතිහාසයේ මූලාරම්භයේ සිටම සක්‍රිය වූ ක්‍රියාදාමයකි. විවිධ කාලවල අධ්‍යාපනය පිළිබඳ තත්කාලීන සමාජ ව්‍යුහයට අනුරූපව පර්යේෂණ හා අත්හදා බැලීම් සිදු කොට ඇති බවට සාක්ෂි පවතී. එසේ වුවද කිසිදා නොවිසඳුනු ප්‍රශ්න රැසක් සදාකාලික ලෙස අධ්‍යාපනය තුළ කිඳා බැස ඇති බව ද නොරහසකි. වර්තමානය වන විට අධ්‍යාපන ක්‍රියාවලිය විවිධ මං තල ඔස්සේ වැඩි දියුණු වෙමින් ඓතිහාසික, දාර්ශනික, මනෝවිද්‍යාත්මක සමාජවිද්‍යාත්මක ආදී වශයෙන් ප්‍රති සංවර්ධනය වෙමින් පවතී. එමුතු නොව කාලයෙන් කාලයට අත්‍යවශ්‍ය සංශෝධනයන් තුළින් අධ්‍යාපනය සමාජ ව්‍යුහය තුළ ආත්මීයකරණය සඳහා ගන්නා වූ ක්‍රියාදාමයන්ද අඩු නොවේ.

අධ්‍යාපනය උදෙසා විවිධ පුද්ගලයන් විසින් කරනු ලබන විවිධ පර්යේෂණ හා සමීක්ෂණ තුළින් සොයා ගන්නා වූ නවීකරණය කළයුතු හා සකස් කළයුතු තැන් පිළිබඳව ලබා දෙන්නා වූ යෝජනා ඉතාම වැදගත් තැනක් ගනු ලැබේ. එසේම ඒ තුළින් අධ්‍යාපනය උදෙසා නිර්මාණය වී ඇති මූලධර්ම මහා සාගරයක් සේ විශාලය. ගැඹුරුය. එහෙයින්ම අප සමාජ පද්ධතිය තුළ මෙම සකලවිධ මූලධර්මයන් ක්‍රියාවට නැංවීමද ප්‍රායෝගික ගැටළුවකි. එසේ හෙයින් අත්‍යාවශ්‍ය වන්නා වූ ද අතිශයින්ම ප්‍රායෝගික වන්නා වූ ද මූලධර්ම හා යෝජනා පමණක් තෝරා බේරාගෙන ක්‍රියාත්මක කිරීමට යත්න දැරීම සෑම විටම සිදුවේ.

අධ්‍යාපන ක්‍රියාවලිය තුළ නිරන්තරයෙන්ම අසන්නට ලැබෙන සංකල්පයක් ලෙස 'කළමනාකරණය' හඳුන්වා දිය හැකිය. සෙසු වෙනත් අංශවල සේම අධ්‍යාපනය තුළද මනා කළමනාකරණයක් තිබිය යුතුය. කළමනාකරණය වඩා ක්‍රමවත් වූ තරමින් අධ්‍යාපන ක්‍රියාවලිය වඩා සාර්ථක වන බව සත්‍ය වශයෙන්ම හඳුනාගෙන ඇති බැහැර කළ නොහැකි සත්‍යයකි. පාසල් පද්ධතිය තුළ කළමනාකරණය වචනය බොහෝ විට භාවිතා වන්නේ මානව හා භෞතික සම්පත් සම්බන්ධයෙනි. එහෙයින් මෙම සම්පත් නිසි අයුරින් කළමතුකරණය කිරීම අධ්‍යාපනය සංවර්ධනයට මහෝපකාරී වේ.

University of Colombo
Library
Sri Lanka

පාසල් වල මානව හා භෞතික සම්පත් කළමනාකරණයේදී නොයෙක් ගැටළු හා දුෂ්කරතාවයන්ට මුහුණ පායි. එහෙයින් මෙම අධ්‍යයනයෙන් පර්යේෂකයා අපේක්ෂා කරන්නේ පාසල් වල මානව හා භෞතික සම්පත් කළමනාකරණයේ ඇතිවන ඌනතා හඳුනාගෙන එම ඌනතා අවම කිරීමට කළහැකි ප්‍රතිකාර්ය යෝජනා ඉදිරිපත් කිරීමය. මෙම කාර්යයේදී අධ්‍යයනය පරිච්ඡේද පහක් යටතේ සැලසුම් කොට ඉදිරිපත් කර ඇත.

පළමුවන පරිච්ඡේදයේ අධ්‍යයනයේ පසුබිම හා ගැටළු හැඳින්වීම සඳහා යොදා ගන්නා ලදී. ඒ අනුව වර්තමානයේ වන විට අධ්‍යාපන සම අවස්ථා ව්‍යාප්ත වී ඇති ආකාරය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පහසුකම් යටතේ පාසල් සංඛ්‍යාව, ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරු සංඛ්‍යාව ආදිය පිළිබඳවත් මානව හා භෞතික සම්පත් පිළිබඳ හැඳින්වීමක් සිදු කර ඇත. අධ්‍යයනය සඳහා යොදාගත් 2 වර්ගයේ පාසල් ශ්‍රී ලංකාවේ පලාත් බදව ව්‍යාප්ත වී ඇති ආකාරය අධ්‍යාපන සම්පත් කළමනාකරණය හා අධ්‍යයනයේ ඇති වැදගත්කම පිළිබඳවද මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇත.

දෙවන පරිච්ඡේදය තුළින් අධ්‍යයනයට අදාල පර්යේෂණ තොරතුරු ඉදිරිපත් කර තිබේ. මෙහිදී අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විවිධ අධ්‍යාපනඥයින් විසින් ඉදිරිපත් කර ඇති අදහස් භෞතික හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඉදිරිපත් කර ඇති මත හා ඒ ආශ්‍රිතව දේශීය වශයෙන් කර තිබෙන පර්යේෂණ හා තොරතුරුද විදේශීය වශයෙන් කර තිබෙන පර්යේෂණ හා තොරතුරුද අන්තර් ගත කර ඇත. එසේම මෙම පරිච්ඡේදය තුළින් අදාල අධ්‍යයනයට හේතු වූ කරුණුද පෙන්වා දී ඇත.

තෙවන පරිච්ඡේදය තුළින් අධ්‍යයනයේ ක්‍රම පිළිවෙත විස්තර කර ඇත. පර්යේෂණ ගැටළුව හැඳින්වීම, අධ්‍යයනය සඳහා තෝරාගත් ප්‍රදේශ හා නියැදිය හැඳින්වීම, දත්ත රැස් කරන උපකරණ හා දත්ත රැස් කිරීමේ පිළිවෙත පර්යේෂණ සීමා යනාදිය පිළිබඳ විස්තරයන් මෙම කොටසේදී සිදු කර ඇත.

සිව්වන පරිච්ඡේදය තුළින් අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය හා අර්ථ කථනය කර ඇත. මෙහිදී ලබා ගත් දත්ත සංඛ්‍යාත්මක, ප්‍රතිශතක වශයෙන් හා ගුණාත්මක වශයෙන් ඉදිරිපත් කර ඇත. පස්වන පරිච්ඡේදය නිගමනය හා යෝජනා ඉදිරිපත් කර ඇත. නිගමන යටතේ මානව හා භෞතික සම්පත් කළමනාකරණය යටතේ වෙන් වෙන් වශයෙන් කරුණු පෙන්වා දී ඇත. මානව සම්පත් කළමනාකරණ යෝජනා සැලසුම් කිරීම, මෙහෙයවීම, පාලනය යන කොටස් යටතේද, භෞතික සම්පත් කළමනාකරණ යෝජනා සම්පත් ලබා ගැනීම, සම්පත් ප්‍රයෝජනයට ගැනීම, සම්පත් ආරක්ෂා කිරීම, සම්පත් වැඩි දියුණු කිරීම හා සංරක්ෂණය යනාදි කරුණු ඔස්සේ ඉදිරිපත් කර ඇත.

මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණයේදී සැබවින්ම අප දන්නා දුර්වලකම් රාශියක් සේම සැඟවුනු දුර්වලතා රාශියක්ද පවතින බව පර්යේෂණයෙන් හෙළි විය. මානව සම්පත් කළමනාකරණයේදී පවතින විශාලතම දුර්වලතාවක් ලෙස සොයාගත හැකිවූයේ ආකල්ප ප්‍රශ්නයකි. විදුහල්පති හා ගුරු මණ්ඩලය තුළ පවතින අනාත්මීය බව මෙයට හේතු වී ඇත. විදුහල්පති හා ගුරු මණ්ඩලය ප්‍රතිවිරුද්ධ මතවාදවල සිටීම හෝ ප්‍රතිවිරුද්ධ අදහස් දැරීම ප්‍රබල ගැටළුවකි. මේ දෙපාර්ශ්වයම ආත්මීය කළ හැකි යම්කිසි ක්‍රියාදාමයක් හෝ නෛතික දැනුවත් කිරීමේ ක්‍රමයක් ඇති කළ යුතු බව පර්යේෂකයාගේ හැඟීමයි. භෞතික සම්පත් බොහෝ පාසල් වලට අවශ්‍යම ප්‍රමාණයට නැතත් පාසල පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් සමුදායක් පවතී. එහෙත් පවතින භෞතික සම්පත් මනා කළමනාකරණයක් නොමැති කමින් ඒවා නාස්තිවීම්, අපතේයාම් වැඩි වී ඇත. එහෙයින් මෙම සම්පත් නිසි අයුරින් භාවිතයට ගැනීමෙන් සම්පත් ඵලදායිතාව වැඩිකර ගත හැකිය.

අධ්‍යයනය තුළින් නිරාවරණය වූ කරුණු ශෝධනය කිරීම සඳහා පර්යේෂකයා කරනු ලබන යෝජනා ප්‍රයෝගික වශයෙන් එතරම් ගැටළු සහිත නොවන අතර ක්‍රියාත්මක කිරීමද අපහසු නොවනු ඇත. එබැවින් මානව හා භෞතික සම්පත් කළමනාකරණය වඩාත් සාර්ථක කර ගැනීමට උනන්දු වන සෑම දෙනා විසින්ම අධ්‍යයනය කළ යුතු වැදගත් පර්යේෂණයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය.